---

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පෙර වර්ෂයට අදාල ආයෝජන පොලී රු.323,874 ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව දේශීය ණය හා සංවර්ධන අරමුදලට ණය වාරික හා පොලී රු.45,907 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු ආයෝජන පොලී රු.520,400 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). ඉකුත් වර්ෂයේදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.33,834 ක වරිපනම් බදු සඳහා ලබාදුන් වට්ටම ගණනය කර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.83,515 ක වරිපනම් බදු සඳහා ලබාදුන් රු.12,238 ක වට්ටම ඉදිරියට ලැබූ වට්ටම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය තුලදී හිඟ වරිපනම් අයකිරීමේදී අයකල රු.27,218 ක වරෙන්තු ගාස්තුව වරිපනම් බදු ගිණුම හරකර වරෙන්තු ගාස්තු හා දඩ මුදල් ගිණුමට බැර කල යුතු වුවත්, අයකල වරෙන්තු ගාස්තුව වරිපනම් බදු යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර වශයෙන් ලැබී තිබූ රු.16,502,622 ක වැටුප් ප්‍රතිපූරණ මුදල්, සේවක මණ්ඩල අනුපාතය යටතේ වැඩසටහන් අතර බෙදා වෙන් නොකර වැඩසටහන් අංක 1 පොදු පරිපාලනය යටතේ පමණක් දක්වා තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය තුල වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අඩු ආදායම් ලාභීන් සවිබල ගැන්වීම් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු රු.150,000 ක් වටිනා පොත් තොගයේ වටිනාකම ආදායම් ආධාර ගිණුමට හා වැය ගිණුමට ගලපා නොතිබූ අතරම ප්‍රාග්ධනීත ද කර නොතිබුණි.

(ඌ). පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන වයඹ පළාත් පාලන සේවා ප්‍රණාම උළෙල 2010 යටතේ ශ්‍රේණිගත නොවූ පුස්තකාල අතර තරඟයෙන් දෙවන ස්ථානය ලබාගැනීම වෙනුවෙන් ලැබුණු රු.100,000 ක මුදල ආදායම් වශයෙන් ගිණුම් ගතකර නොතිබූ අතර, එම මුදලින් ලබාගත් රු.75,000 ක් වටිනා ලීබඩු හා කාර්යාල උපකරණ ද රු.25,000 ක් වටිනා පුස්තකාල පොත් වටිනාකමද, වැය ගිණුමට ගැලපීම හා ප්‍රාග්ධනීත කර ද නොතිබුණි. තවද මෙම පොත් ලබාගැනීමේදී ලැබුණු රු.2,775 ක වට්ටම වෙනත් ආදායම් ලැබීමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(එ). සමාලෝචිත වර්ෂය තුල විවිධ ආයතන හා පුද්ගලයින් ගෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.36,437 ක පොත් තොගයේ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ඒ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් ඉදිරියේදී අයකල යුතු රු.3,285 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදී වැටුප් රහිත නිවාඩු ගිණුමට හරකර වැටුප් හා වේතන වියදම් ගිණුමට බැරකර නොතිබුණි.

(ඔ). පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දේශීය ණය හා සංවර්ධන අරමුදල හරහා 60% ක ප්‍රදානයක් 33% ක ආපසු ගෙවිය යුතු ණය මුදලක් හා 7% ක් සභා දායකත්වයක් යටතේ අරමුදල් සම්පාදනය කරගෙන ඉදිකිරීමට නියමිත බහු කාර්ය සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2010 වර්ෂයේදී ගිවිසුම් වලට එළඹ 2010 වර්ෂය අවසන් වන විට ඉහත ව්‍යාපෘතියෙන් රු.1,084,170 ක මුදලක් ලැබී කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණ මුත් 60% ක ප්‍රදානය වූ රු.24,613,231 ක මුදල මූලධන ආධාර යටතේ ද 33% ක ණය මුදල වූ රු.13,537,277 ක මුදල ණය ගිණුම යටතේ ද ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයකට අදාල පාලන ගිණුම් අනුව ශේෂය රු.8,075,116 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.6,819,014 ක් විය.

1.3.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

ගිණුම් විෂයයන් 3 කට අදාලව පැහැදිලි නොකල රු. 1,081,694 ක ශේෂයක් පැවතුණි.

1.3.4 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.33,013,316 ක් වූ අතර එයින් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර තිබූ රු.29,600,812 කට අදාලව වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු.3,932,473 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

--------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.43,137,092 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.15,848,612 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.9,186,136 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත සඳහන් මූල්‍ය පාලන ඌණතා /අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). දෛනිකව එකතු කරන ලද මුදල් බැංකු ගතකරන ආකාරය දක්වමින් පැහැදිලිව අධීක්ෂණය හා පරීක්ෂා කලහැකි අයුරින් ලේඛනයක් පවත්වා නොතිබූ අතර, දෛනිකව සේප්පුවේ පවතින මුදල් පිළිබඳ ලේඛනයක්ද නඩත්තු කර වගකිව යුතු නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්කර නොතිබුණි. 2010 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට අදාලව දෛනික ලැබීම් හා බැංකු ගත කිරීම් පරීක්ෂාවේදී 2010 නොවැම්බර් 29 දිනට වූ දෛනික ලැබීම් රු.89,496 ක් අඩුවෙන් බැංකු ගතකර තිබුණි.

(ආ). බැංකු ගිණුමකට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 61,703 ක් වටිනා චෙක්පත් 04 ක් පැවතුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක ණය ලේඛණය තුලනය කර නොතිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 2,029 | 889 | 1,140 | 1,463 | 610 | 853 |
| (ii) | බදුකුලී | 9,564 | 9,051 | 513 | 8,666 | 8,281 | 385 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,692 | 1,471 | 221 | 1,346 | 1,311 | 35 |
| (iv) | වෙනත් ආදායම් | 101,955 | 80,815 | 21,140 | 101,377 | 64,188 | 37,189 |
| | එකතුව | 115,240 | 92,226 | 23,014 | 112,852 | 74,390 | 38,462 |

2.3.2 <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකල රු.633,438 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 <u>මුද්දර ගාස්තු</u>

2010 දෙසැම්බර් 31 උනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.11,082,122 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.4 <u>කඩ කාමර බදුදීම</u>

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 කට වරක්වත් තක්සේරු ගත කුලිය සංශෝධනය කළයුතු වුවත්, නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 36 සඳහා 1998 සිට මාසික කුලිය රු.694 සිට රු.919 ක පරාසයක් තුල හා කඹුරාපොල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 සඳහා 2000 වර්ෂයේ සිට රු.344 ක මාසික කුලියක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර තිබුණි.

2.3.5 <u>වරිපනම් බදු</u>

වරිපනම් ඒකක 21 කට අදාලව රු.89,350 ක හිඟයක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අතර, එකී කාල පරාසය වසර 7 සිට 22 ක් අතර විසිර පැවතුණි. මෙකී හිඟයන් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති 33 සිට 41 පරිදි කටයුතු කර නොතිබුණි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 161 ඡේදයට අනුව, අදාල කාර්තුව තුල නොගෙවන වරිපනම් සඳහා අධි ගාස්තු බිල්කල යුතු වුවත් එලෙස අධි ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

2.3.6 <u>අක්කර බදු</u>

සභාවේ අක්කර බදු අයකිරීමට අදාලව පැවති ලේඛණ වල අදාල ඉඩමේ නම, ප්‍රමාණය වැනි තොරතුරු ඇතුළත් කර නොතිබූ අතරම ක්ෂේත්‍ර පරීක්ෂණයක් මගින් අක්කර බදු ලේඛන ලිවීම සිදුකර නොතිබුණි. අක්කර බදු ලේඛණ අනුව දිගුකාලීනව අයනොවන ශේෂයන් පැවති අතර බදුකරුවන් 14 දෙනෙකුට අදාලව රු.30,979 ක හිඟයක් පැවති අතර, හිඟ කාල පරාසය වසර 7 සිට 22 දක්වා විසිර පැවතුණි. මෙකී කාල පරාසවල නිවැරදිතාවයද විගණනයේදී තහවරු නොවූ අතර, හිඟ අයකර ගැනීම සඳහා ද

ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ අංක 43 රීතියෙහි දක්වා ඇති පරිදි රීති අංක 33 සිට 41 පරිදි කටයුතු කර නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,581 | 22,169 | 1,412 | 23,226 | 21,943 | 1,283 |
| අනෙකුත් | 16,861 | 17,208 | (347) | 14,208 | 15,392 | (1,184) |
| උප එකතුව | 40,442 | 39,377 | 1,065 | 37,434 | 37,335 | 99 |
| ප්‍රාග්ධන වියදම | 84,853 | 58,192 | 26,661 | 11,390 | 39,262 | (27,872) |
| මුළු එකතුව | 125,295 | 97,569 | 27,726 | 48,824 | 76,597 | (27,773) |

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 05 | 03 |
| ද්විතීයික | 21 | 16 |
| ප්‍රාථමික | 53 | 47 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 21 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.38,460,247 ක් වූ අතර, ඒ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.190,981 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.186,231 ක් විය.

2.6.3 සමීක්ෂණය නොකළ වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් විෂයයන් 5 ක් යටතේ භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.27,482,803 ක් විය.

(ආ). මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සැම වසරකට වරක් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවද, 2009 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි. 2010 දෙසැම්බර් 07 දින සිදුකල සෝදිසි පරීක්ෂාව අනුව ගබඩා භාණ්ඩ අක්‍රමවත්ව පැවති අතර, වාහන වලින් ඉවත් කරන ලද ටයර් 25 කට වැඩි ප්‍රමාණයක් හා වාහන උපාංග, හිස් තීන්ත බාල්දි, යතුරුලියන යන්ත්‍ර වැනි දෑ ගබඩාවේ අක්‍රමවත්ව තබා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 2,859,705 ක්ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 9,971 බැගින් එකී අරමුදල විසින් අය කර තිබුණද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් කර නොතිබුණි.

(ආ). සභාවේ බලපත්‍ර ගාස්තු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයෙදී කළුගල් මෝල්, ලී මෝල්, වඩුමඩු, කොහුමෝල් වැනි පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන 83 ක් පමණ පැවතියද, එයින් පරිසර බලපත්‍ර ලබාගෙන තිබුනේ ව්‍යාපාරික ස්ථාන 35 ක් සඳහා පමණි. එමෙන්ම පරිසර බලපත්‍ර ලබාගෙන තිබූ ව්‍යාපාරික ස්ථාන 30 ක් වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

2.8 කාර්ය සාධනය

(අ) ප්‍රතිපාදන ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) අයවැය ලේඛණය මගින් සමාලෝචිත වර්ෂය තුල මිලදී ගැනිමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.100,000 ක තණකොළ කපන යන්ත්‍රය මිලදී ගැනීම සිදුකර නොතිබුණි.

(II). අයවැය ලේඛණය මගින් සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදල් මගින් ඉටු කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.1,300,000 ක් වූ කර්මාන්ත 05 ක් හා ඇස්තමේන්තු ගත පිරිවැය රු.2,700,000 ක් වූ පළාත් සභා ආධාර යටතේ වූ කර්මාන්ත 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I). මහා මාර්ග අමාත්‍යාංශ ආධාර යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තු පිරිවැය රු.5,000,000 ක් වූ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ ව්‍යාපෘති 10 න් රු.500,000 බැගින් වූ ව්‍යාපෘති 2 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණ.

(II). සමාලෝචිත වර්ෂය තුල පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සහජවන ගම්මාන වැඩසටහන සඳහා රු.250,000 ක ප්‍රතිපාදනයක් ප්‍රාදේශීය සභාවට 2010 සැප්තැම්බර් 02 දින ලැබී තිබුණි. අදාල ව්‍යාපෘති වාර්තා අනුව මෙකී ව්‍යාපෘතිය 2010 නොවැම්බර් වන විට අවසන් කළයුතු වුවත්, ඇස්තමේන්තුගත පිරිවැය රු.50,000 ක් වූ බෝක්කුවක් ඉදිකිරීම සහ පිරිවැය රු.24,500 ක් වූ මීමැසි ජනපද 15 ක් මිළදී ගැනීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුවී නොතිබුණි.

(III). මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු වැඩසටහන යටතේ කුඩා පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා 2010 ඔක්තෝබර් 06 දින රු.1,540,026 ක මුදලක් ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණද, ව්‍යාපෘති සඳහා යෝජිත ඉඩමේ පැවති ගැටළුව නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර, එයින් රු.1,000,000 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

(IV). සභා සීමාව තුල දිනපතා එකතුවන ප්‍රතිචක්‍රීයකරණය කල හැකි ද්‍රව්‍ය එකතු කර අතරමැදි ගැණුම්කරුවන් වෙත විකුණා අමතර ආදායමක් ලබාගත හැකි වන ලෙස ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයන් 5 දෙනෙකු වෙත එකක් රු.12,100 බැගින් වූ ට්‍රේලරයක් සහිත පාපැදිය බැගින් මිළදී ගෙන ස්වයං රැකියා ව්‍යාපෘතියක් කරගෙන යාමට 2008 වර්ෂයේදී බෙදා දී තිබුණි. එයින් පාපැදි 4 ක් හා ට්‍රේලර් 4 ක් අදාල ප්‍රතිලාභීන් විසින් 2010 මාර්තු මස ආපසු සභාවට භාරදී තිබූ අතර, එදින සිට ඒවා ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබූ අතර එකී ව්‍යාපෘතියේ අරමුණ ද ඉටුවී නොතිබුණි.

2.9 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය